// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1691/49 - 2011 පෙබරවාරි 02 වැනි බදාදා - 2011.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

**2000 අංක 56 දරන කල්බදු මුල්‍යකරණ පනත**

2000 අංක 56 දරන කල්බදු මුල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ දෙනු ලබන විධානය.

කේ. එම්. ඒ. එන්. දවුලගල,
අධ්‍යක්ෂ,
බැංකු නොවන මුල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වර්ෂ 2010 ක් වූ දෙසැම්බර් මස 09 වැනි දින,

2010 අංක 3 දරන කල්බදු මුල්‍යකරණ (ශාඛා/ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම/ස්ථානය වෙනස් කිරීම/වැසීම) විධානය

1. මෙම විධානය 2010 අංක 3 දරන කල්බදු මුල්‍යකරණ (ශාඛා/ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම/ස්ථානය වෙනස් කිරීම/වැසීම) විධානය යනුවෙන් හඳුන්වන අතර, 2000 අංක 56 දරන කල්බදු මුල්‍යකරණ පනතේ 3 වැනි වගන්තියේ *(ඇ)* ඡේදයේ විධිවිධානයන්ට අනුව සියලු ලියාපදිංචි කල්බදු මුල්‍යකරණ ආයතනයකට ම (මෙහි මින්මතු "විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) අදාළ වේ. මෙම විධානය වහාම බලපවත්වන පරිදි ක්‍රියාත්මක වේ. හැඳින්වීම

2. අධ්‍යක්ෂකගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව විශේෂිත කල්බදු මුල්‍යකරණ සමාගම්වලට ශාඛා/ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම/ස්ථානය වෙනස් කිරීම/වැසීම සිදුකිරීම කළ නොහැකිය. මෙහි ව්‍යාපාර ස්ථාන යන්නට කාර්යාල, සේවා කවුළු, සේවා මධ්‍යස්ථාන හෝ විශේෂිත කල්බදු මුල්‍යකරණ සමාගම මඟින් පවත්වාගෙන යන වෙනත් ඕනෑ ම ආකාරයක ව්‍යාපාර ස්ථානයක් අදහස් වේ.

3. විශේෂිත කල්බදු මුල්‍යකරණ සමාගම්වල නව ශාඛාවක් හෝ ව්‍යාපාර ස්ථානයක් විවෘත කිරීම සඳහා අවසරය ලබාදීමේදී ඇගයීමේ සලකා බලන නිර්ණායක පහත පරිදි වේ:- ඇගයීමේ නිර්ණායක

*(අ)* අවසන් වරට විගණනය කළ මුල්‍ය වාර්තාවල දැක්වෙන මූලික ප්‍රාග්ධනය;

*(ආ)* 2000 අංක 56 දරන කල්බදු මුල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද නියෝග/විධාන/උපදෙස්වලට අනුකූල වී ඇති ප්‍රමාණය;

*(ඇ)* ව්‍යාපාර/මුල්‍ය පැතිකඩ හා ලාභදායීතාවය;

*(ඇ)* වත්කම්වල ගුණත්වය;

*(ඉ)* ද්‍රවශීලතා මට්ටම;

*(ඊ)* සෑම මට්ටමක් සඳහා ම සුදුසුකම්ලත් හා පළපුරුදු කාර්ය මණ්ඩලයක් යෙදවීමේ හැකියාව;

*(උ)* යෝජිත ස්ථානය ගනුදෙනුකරුවන්ට ඇති පහසුව; සහ

*(ඌ)* තොරතුරු තාක්ෂණයේ ශක්තිමත් බව.

ණය උපකරණ නිකුත් කිරීම

4. ණය උපකරණ නිකුත් කිරීම කළ හැක්කේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ ප්‍රධාන කාර්යාලයට හෝ ශාඛාවනට පමණි.

අයදුම්පත්

5. අනුමැතිය ලබාගැනීම සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් පහත සඳහන් අයැදුම්පත් ආකෘති භාවිතා කළ යුතු යඃ-

(i) "A" ආකෘතිය — නව ශාඛාවක්/ව්‍යාපාර ස්ථානයක් විවෘත කිරීම සඳහා;

(ii) "B" ආකෘතිය — පවතින ශාඛා/ව්‍යාපාර ස්ථාන වැසීම සඳහා;

(iii) "C" ආකෘතිය — ශාඛාවක්/ව්‍යාපාර ස්ථානයක්, පවතින ස්ථානය වෙනස් කිරීම සඳහා.

වලංගු කාලය

6. අදාළ අනුමැතිය ලබාදුන් දින සිට මාස 6 ක කාලයක් එම අනුමැතිය වලංගු වේ.

ව්‍යාපාර කාලය

7. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය ප්‍රකාශ කරන ලද නිවාඩු දිනයන්වල හැර අන් කිසිම දිනක දී විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතනයක් එහි කිසිදු ශාඛාවක්/ව්‍යාපාර ස්ථානයක් අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතියකින් තොරව ව්‍යාපාර කටයුතු සඳහා වැසිය නොහැක.

'A' *ආකෘතිය*

**නව ශාඛාවක්/ව්‍යාපාර ස්ථානයක්/විවෘත කිරීමේ අයැදුම්පත**

1. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ නමඃ ............................................................................................
2. වර්ගයඃ ප්‍රධාන කාර්යාලය/ශාඛාව/ශාඛා කවුළුව/සේවා මධ්‍යස්ථාන/වෙනත් කාර්යාල...................................................
3. මූලික ප්‍රාග්ධනය (අවසන් විගණනය කළ ශේෂ පත්‍රයට අනුව) ඃ .............................................................................
4. යෝජිත ස්ථානයේ ලිපිනයඃ.......................................................................................................................
5. ශාඛාව/ව්‍යාපාර ස්ථානය පිහිටුවීමට යෝජිත පරිපාලන දිස්ත්‍රික්කය තුළ පවතින සමාගම හෝ එයට අදාළ සමාගම් සතු ව්‍යාපාර ස්ථානවල තොරතුරුඃ .............................................................................................

*(අ) අයැදුම් කරන සමාගම ඃ*

| *ව්‍යාපාර ස්ථානයේ පිහිටීම* | *පිහිටුවන ලද දිනය* | *ව්‍යාපාර වර්ගය* | *අවසන් විගණනය කළ මූල්‍ය වාර්තාවල දැක්වෙන පරිදි (රු. '000)* | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | *මුළු ණය පහසුකම්* | *කල්බදු මූල්‍ය කිරීම්* | *ණය උපකරණ නිකුත් කිරීම මගින් කළ ණය ගැනීම්* | *මුළු වත්කම්* | *මුදල් වර්ෂයේ ලාභය/ (අලාභය)* |
| | | | | | | | |
| | | | | | | | |

*(ආ)* ශාඛාව/ව්‍යාපාර ස්ථානය පිහිටුවීමට යෝජිත පරිපාලන දිස්ත්‍රික්කය තුළ පවතින, සමාගම් සමූහයට අයත් වෙනත් ආයතනඃ

| *ආයතනයේ නම* | *ව්‍යාපාර ස්ථානයේ ලිපිනය* | *ව්‍යාපාර වර්ගය* | *සමාගම සමග ඇති සම්බන්ධතාවය* |
|---|---|---|---|
| | | | |
| | | | |

6. යෝජිත ශාඛාව/ව්‍යාපාර ස්ථානය පිහිටුවීමට නියමිත නගරයේ/ග්‍රාමයේ ඇති වෙනත් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල නම් : .........................................

7. යෝජිත ශාඛාව/ව්‍යාපාර ස්ථානය පිහිටුවීමට නියමිත නගරයේ/ග්‍රාමයේ ඇති වාණිජ බැංකු හා ලියාපදිංචි මුදල් සමාගම්වල නම්ඃ .........................................

8. යෝජිත ශාඛාවේ/ව්‍යාපාර ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාර කටයුත්තඃ .........................................

9. නව ශාඛා/ව්‍යාපාර ස්ථානය විවෘත කිරීමට අදාළ තක්සේරු කළ ප්‍රාග්ධන වියදමඃ

*(අ)* ඉඩම් හා ගොඩනැගිලි/ඉදිරියට කළ කුලී ගෙවීම්: .........................................
*(ආ)* ගෘහ භාණ්ඩ, උපකරණ හා සවිකිරීම්:.........................................
*(ඇ)* කාර්යාල උපකරණ:.........................................
*(ඈ)* වෙනත් ස්ථාවර වත්කම්:.........................................
*(ඉ)* වෙනත් :.........................................

10. ප්‍රධාන කාර්යාලය සහ යෝජිත ශාඛාව/ව්‍යාපාර ස්ථානය අතර තොරතුරු හුවමාරුවන/සන්නිවේදනය වන මාධ්‍යඃ (එනම් මැසෙන්ජර්, කුරියර් සේවාව/ෆැක්සිමයිල්/ඔන් ලයින් පද්ධතිය) සහ තොරතුරු සන්නිවේදනය වන වාර ගණන (එනම් දිනපතා/සතිපතා/මාසිකව) .........................................

11. යෝජිත ශාඛාව/ව්‍යාපාර ස්ථානයේ ප්‍රථම වසර 3 ට අදාළ ප්‍රක්ෂේපනයන්:

| | | *ප්‍රථම වසර* | *දෙවන වසර* | *තෙවන වසර* |
|---|---|---|---|---|
| *(අ)* ණය පහසුකම්: | | | | |
| කල්බදු මූල්‍ය කිරීම් | — | ------------ | ------------ | ------------ |
| කාලීන ණය | — | ------------ | ------------ | ------------ |
| කුලීපිට ගැණුම් | — | ------------ | ------------ | ------------ |
| ණය සාධනය කිරීම් | — | ------------ | ------------ | ------------ |
| දේපළ වෙළඳාම් | — | ------------ | ------------ | ------------ |
| වෙනත් | — | ------------ | ------------ | ------------ |
| *(ආ)* ණය ගැනීම්: | | | | |
| පොරොන්දු නෝට්ටු | — | ------------ | ------------ | ------------ |
| වාණිජ පත්‍රිකා | — | ------------ | ------------ | ------------ |
| *(ඇ)* ආදායම: | | | | |
| පොළී ආදායම | — | ------------ | ------------ | ------------ |
| කල්බදු මූල්‍ය කිරීම් | — | ------------ | ------------ | ------------ |
| කාලීන ණය | — | ------------ | ------------ | ------------ |
| කුලීපිට ගැණුම් | — | ------------ | ------------ | ------------ |
| ණය සාධනය කිරීම් | — | ------------ | ------------ | ------------ |
| දේපළ වෙළඳාම | — | ------------ | ------------ | ------------ |
| වෙනත් | — | ------------ | ------------ | ------------ |
| පොළී නොවන ආදායම | — | ------------ | ------------ | ------------ |
| *(ඈ)* වියදම්: | | | | |
| ණය උපකරණ මත පොළී | — | ------------ | ------------ | ------------ |
| වැටුප් හා වේතන | — | ------------ | ------------ | ------------ |
| කුලී වියදම් | — | ------------ | ------------ | ------------ |
| ක්ෂය වීම් | — | ------------ | ------------ | ------------ |
| වෙනත් වියදම් | — | ------------ | ------------ | ------------ |
| *(ඉ)* ලාභය/(අලාභය): | — | ------------ | ------------ | ------------ |

12. යෝජිත ශාඛාවට/ව්‍යාපාර ස්ථානයට කළමනාකරු (භාරකාර නිලධාරි) ලෙස අනුයුක්ත කිරීමට නියමිත නිලධාරීන්ගේ හා දෙවන නිලධාරීන්ගේ නම්, සුදුසුකම් හා පළපුරුද්ද සහ සහකාර සේවකයන් පිළිබඳ තොරතුරුඃ

13. යෝජිත ස්ථානයේ ශාඛාව/ව්‍යාපාර ස්ථානය පිහිටුවීම සඳහා අදාළ පළාත් පාලන අධිකාරියෙන් අනුමැතිය ලබාගෙන ඇත් ද යන්න:.........................................

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

නිලධාරියාගේ නම:.........................................
තනතුර :.........................................
අත්සන :.........................................
දිනය :.........................................

*'B'* *ආකෘතිය*

**ශාඛාවක්/ව්‍යාපාර ස්ථානයක් වසා දැමීම සඳහා අයැදුම්පත**

1. විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතනයේ නම:.........................................
2. වර්ගයඃ ප්‍රධාන කාර්යාලය/ශාඛාව/සේවා කවුළුව/සේවා මධ්‍යස්ථාන/අනෙකුත් වෙළඳසැල්:.........................................
3. වසා දැමීමට යන ශාඛාවෙහි/ව්‍යාපාරික ස්ථානයෙහි ලිපිනය:.........................................
4. පහත සඳහන් ආකාරයට වසා දැමීමට යන ස්ථානයේ විස්තර:.........................................

| *වර්ගය* | *ආසන්නතම මූල්‍ය ප්‍රකාශන අනුව රු. දහස්* |
|---|---|
| මූලික ප්‍රාග්ධනය | |
| මුළු ණය පහසුකම්: | |
| මූල්‍ය කල්බදු පහසුකම් (ගිවිසුම් ගණනද ඇතුළත්ව) | |
| කුලීපිට ගැනුම් | |
| මුළු ණය ගැනීම්: | |
| පොරොන්දු නෝට්ටු මගින් ණය ගැනීම් | |
| වාණිජ පත්‍ර මගින් ණය ගැනීම් | |
| අනෙකුත් ණය ගැනීම් | |
| මුළු වත්කම් | |
| ලාභය/(අලාභය) | |
| ණය උපකරණ සම්බන්ධයෙන් වන ආයෝජකයින් සංඛ්‍යාව | |

5. ශාඛාව/ව්‍යාපාර ස්ථානය වසා දැමීම සඳහා අදාළ පළාත් පාලන අධිකාරියෙන් අනුමැතිය ලබාගෙන ඇත්ද යන්න:..........

6. ඉහත ව්‍යාපාරික ස්ථානයට අදාළ වන ණය උපකරණ හිමි ආයෝජකයන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග:..................

7. ශාඛාව/ව්‍යාපාර ස්ථානය වසා දැමීම සම්බන්ධයෙන් වන සාධාරණ හේතූන්:......................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

නිලධාරියාගේ නම:..........................................................
තනතුර :..........................................................................
අත්සන :........................................................................
දිනය :............................................................................

*'C' ආකෘතිය*

**ශාඛාවක්/ව්‍යාපාර ස්ථානයක් පවතින ස්ථානය වෙනස් කිරීම සඳහා අයැදුම්පත**

1. විශේෂිත කල්බදු මුල්‍යකරණ ආයතනයේ නම :..........................................................
2. වර්ගයඃ ප්‍රධාන කාර්යාලය/ශාඛාව/සේවා කවුළුව/සේවා මධ්‍යස්ථාන/අනෙකුත් වෙළඳසැල් :............................
3. වර්තමාන ව්‍යාපාර ස්ථානයේ ලිපිනය:.........................................................
4. යෝජිත ව්‍යාපාර ස්ථානයේ ලිපිනය:..........................................................
5. පහත සඳහන් පරිදි පවතින ස්ථානය වෙනස් කිරීමට යන ශාඛාවේ/ව්‍යාපාර ස්ථානයේ තොරතුරු:

| *වර්ගය* | *ආසන්නතම මූල්‍ය ප්‍රකාශන අනුව රු. දහස්* |
|---|---|
| මූලික ප්‍රාග්ධනය | |
| මුළු ණය පහසුකම්: | |
| මූල්‍ය කල්බදු පහසුකම් (ගිවිසුම් ගණන් ද ඇතුළත්ව) | |
| කුලීපිට ගැනුම් | |
| මුළු ණය ගැනීම්: | |
| පොරොන්දු නෝට්ටු මගින් ණය ගැනීම් | |
| වාණිජ පත්‍ර මගින් ණය ගැනීම් | |
| අනෙකුත් ණය ගැනීම් | |
| මුළු වත්කම් | |
| ලාභය/(අලාභය) | |
| ණය උපකරණ සම්බන්ධයෙන් වන ආයෝජකයින් සංඛ්‍යාව | |

6. ශාඛාව/ව්‍යාපාර ස්ථානය දැනට පවතින ස්ථානයේ සිට යෝජිත ස්ථානයට මාරු කිරීමට අවශ්‍ය අනුමැතිය අදාළ පළාත් පාලන අධිකාරියෙන් ලබාගෙන තිබෙනවාද යන්න:............................

7. ශාඛාව/ව්‍යාපාර ස්ථානය මාරු කිරීම සම්බන්ධයෙන් ඇති සාධාරණ හේතුන් ඃ

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

නිලධාරියාගේ නම : ...............................................
තනතුර : ................................................................
අත්සන : ...............................................................
දිනය : ..................................................................

05 - 437

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.